WWW.OLEVELAPI.COM

අවසන් සංශෝධන ඇතුලත්
කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය
## 2010

### ලකුණු දීමේ පටිපාටිය



WWW.OLEVELAPI.COM

# 33 - ඉතිහාසය

මෙය උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. ප්‍රධාන පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි ඇතැම් වෙනස්කම් කරනු ලැබේ. මෙය පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා ආධාරකයක් ලෙසද යොදා ගත හැකිය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# උත්තර පත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

පිළිතුරු පත් ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළයුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- උත්තර පත්‍ර ලකුණු කිරීමට රතුපාට පැන්සලක් හෝ රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- සෑම උත්තර පත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී පහත සඳහන් ක්‍රමය අනුගමනය කරන්න.

1 2 3 4 5 6 7 8 9 0

- ඉලක්කම් ලිවීමේ දී වැරදුනු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

## බහුවරණ උත්තර පත්‍ර - කවුළු පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපීයන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව එය මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර √ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාල කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා: $\frac{60}{100}$ $\frac{20}{30}$

WWW.OLEVELAPI.COM

## ව්‍යුහගත රචනා හා රචනා උත්තර පත්‍ර

- අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති කොටස් හෝ පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

- ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතුවේ.

කිසියම් අයදුම්කරුවකු විෂයට නියමිත ප්‍රශ්න පත්‍ර එකකට (ප්‍රශ්න පත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) පමණක් පෙනී සිටි අවස්ථාවක දී ඉතිරි ප්‍රශ්න පත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රයන්ට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම් නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතුය.

උදාහරණ : - මුළු ලකුණු 100

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



| අවසාන ලකුණු | මුළු ලකුණු | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා:-

කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ අදාල උත්තර පත්‍ර පැකට්ටුව I හා II සියල්ලම ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.
(උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරණ විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකැට්ටුව පමණි.)
කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍ර I හෝ II හෝ III පැකට්ටුව තුල නොමැති අවස්ථාවක දී හා ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් මධ්‍යස්ථානයක සියලුම අයදුම්කරුවනට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

උදා - ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවලදී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා "අවසාන ලකුණු තීරණය කළ නොහැක" යන සටහන යොදන්න. මෙම සටහන උත්තර පත්‍රයේ මුල් පිටුවේ පහල කෙලවරේ ද යොදන්න. මේ පිළිබඳව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් ."9" අයිඑම්එල් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

WWW.OLEVELAPI.COM

මෙම ලකුණු ලැයිස්තු "9" අයිඑම්එල් (9IML) කවරය තුල බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

කොටස් සඳහා දෙන ලකුණු ඒ ඒ කොටස අවසානයේ භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න. උත්තරයකට ලැබුණු මුළු ලකුණු ලිවීමේ දී එක් එක් කොටස සඳහා ලැබුණු ලකුණු උත්තරය අවසානයේ නැවත ලියා ඒවා එකතු කොට දක්වා ඒ වටා කවයක් අඳින්න. නිදසුනක් වශයෙන් ප්‍රශ්න අංක 03 කොටස් තුනකින් යුක්ත නම් හා එක් එක් කොටසට හිමි උපරිම ලකුණු ප්‍රමාණය 05 නම්, ඒ අනුව අයදුම්කරු ලබා ඇති ලකුණු මෙසේ දක්විය යුතුය.

i $\frac{4}{5}$ + ii $\frac{3}{5}$ + iii $\frac{3}{5}$ = 3 ——— $\frac{10}{15}$ (circled)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සෑම උත්තරයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාල කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළයුතුවේ. සියල්ලම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහනක් කර අවසානයේ දී අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂකාර්‍ය මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරලමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමානදැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න ප්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න. (ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශත සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

**අවසාන ලකුණු තීරණය කිරීම**

දින පැකැට්ටුවට අදල සියලු ම උත්තර පත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තර පත්‍රවලට අදල ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :-

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| (i) $\frac{54}{100}$ | (i) $\frac{22}{40}$ | (i) $\frac{60.5}{100}$ |
| (ii) $\frac{67}{100}$ | (i) $\frac{34}{60}$ | (i) $\frac{81}{100}$ |
| (iii) $\frac{36}{100}$ | | |
| 3 \| 157 = 52.33 | | 2 \| 141.5 = 70,75 |
| 52% | 56% | 71% |

WWW.OLEVELAPI.COM

ඉහත උදාහරණවලින් දක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණ පමණක් පූර්ණ සංඛ්‍යා ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 05 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණ විය යුතුය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතුය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

අ.පො.ස. (සා.පෙළ) විභාගය 2010
க.பொ.த.(சா.தர)ப் பரீட்சை 2010

විෂයය / பாடம் } இஸ்லாம்        විෂයය අංකය / பாட இலக்கம் } 033

### ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය
### புள்ளி வழங்கும் திட்டம் - பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 2 | 21. | 3 | 31. | 2 |
| 02. | 3 | 12. | 1 | 22. | 4 | 32. | 3 |
| 03. | 2 | 13. | 3 | 23. | 4 | 33. | 2 |
| 04. | 1 | 14. | 2 | 24. | 3 | 34. | 1 |
| 05. | 1 | 15. | 2 | 25. | 1 | 35. | 1/2 |
| 06. | 1 | 16. | 3 | 26. | 2 | 36. | 4 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 3 |
| 08. | 1 | 18. | 2 | 28. | 1 | 38. | 3 |
| 09. | 3 | 19. | 2 | 29. | 3 | 39. | 3 |
| 10. | 1 | 20. | 2 | 30. | 4 | 40. | 1 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් ප්‍රශ්නයකට / ஒரு சரியான விடைக்கு **02** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்த புள்ளிகள் 02 X 40 = **80**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

ඉතිහාසය II
வரலாறு II
History II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours


※ I කොටසේ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ II කොටසින් ප්‍රශ්න **තුනකට** ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද පිළිතුරු සපයන්න.
※ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි**.

## I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.
   - (i) පරාක්‍රම සමුද්‍රය, ඉරණමඩු වැව, මැණික් ගඟ, අනුරාධපුර, උරාතොට, කොට්ටාය, ගාල්ල, මහියංගනය, ගන්නොරුව, සීතාවක (ලකුණු 10 යි)
   - (ii) කාවේරි ගංගාව, ඊඩෝ (ටෝකියෝ), රතු මුහුද, ගෝවා, මලය අර්ධද්වීපය, තායිවානය (ෆෝර්මෝසා), හොවැංහෝ ගඟ, කාබුල් (ලකුණු 08 යි)

   (ආ) (i) පහත *A, B, C, D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.
   - *A* - ක්‍රි. ව. දෙවැනි ශතවර්ෂයේ දී පමණ ලංකාවේ සිතියමක් නිර්මාණය කළ ග්‍රීක ජාතික භූගෝල විද්‍යාඥයා
   - *B* - ක්‍රි. ව. පස්වැනි සියවසේ දී ලංකාවට පැමිණ අභයගිරි විහාරයේ වසර දෙකක් පමණ ගතකොට ශ්‍රී ලංකාව ගැන ද තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් සම්පාදනය කළ චීන භික්ෂුන් වහන්සේ
   - *C* - සොල්බරි ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමෙහි ලා මුල් වී කටයුතු කළ ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා
   - *D* - සූවස් ඇළ ජනසතු කිරීමට මුල් වූ ඊජිප්තු (මිසර) ජනාධිපතිවරයා (ලකුණු 04 යි)


   (ii) යාබද *A* සහ *B* යටතේ දක්වා ඇති කලා නිර්මාණ හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.




   1. ලෝක උරුමයක් ලෙස සැලකෙන මෙම නිර්මාණය කුමක් ද?
   2. මෙය ගොඩනංවන ලද රජතුමා කවු ද?
   3. කවරකු සිහිවීම සඳහා මෙය නිර්මාණය කරන ලද්දේ ද?
   4. මෙම ස්මාරකය ඉදිකිරීම සඳහා මූලික වශයෙන් යොදාගෙන ඇති පාෂාණ වර්ගය කුමක් ද?

   (ලකුණු 04 යි)

   (iii)




   1. මෙම නිර්මාණය කුමක් ද?
   2. මෙවන් නිර්මාණ දකිය හැක්කේ කවර ගොඩනැගිලි අබියස ද?
   3. මෙහි නිරූපිත සිව්පා සතුන් අතුරෙන් **එක්** සතකු නම් කරන්න.
   4. මෙහි මධ්‍යයේ නිරූපිත පුෂ්පය කුමක් ද?

   (ලකුණු 04 යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka


ඉතිහාසය II
வரலாறு II
History II

33

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

විභාග අංකය
சுட்டெண்
IndeX No. ……………………

1 (අ) (i)




අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ඉතිහාසය II
வரலாறு II
History II

33

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

1. (අ) (ii)




WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

01(ආ)(i) A - ස්ලෙමියස් වොලම් / වොලම්
B - පාහියන් භික්ෂුව
C - ශ්‍රී ජවහර්ලාල් නේරුතුමා / නේරුතුමා
D - අබ්දුල් ගමාල් නසාර්

( ලකුණු 1 X 4 = 04 යි )

(i) 1. ටජ්මහල්
2. ෂාජහාන් රජ
3. මුම්ටාජ්මහල් දේවිය [illegible]
4. කිරිගරුඬ / මාබල්

( ලකුණු 1 X 4 = 04 යි )

(ii) 1. සඳකඩ පහන
2. ආගමික ගොඩනැගිලි අඩියස / [illegible] / [illegible]
3. ගවයා / සිංහයා / අශ්වයා / ඇතා
4. නෙළුම් මල

( ලකුණු 1 X 4 = 04 යි )

02. අපේක්ෂණය : ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන සංවිධානය හා වාරිකර්මාන්තවල වර්ධනය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම.

II කොටස

2. "මෙරට පැවැති ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිපාලන රටාවත්, වාරිමාර්ග තාක්ෂණයත්, ඉතා උසස් මට්ටමක පැවැතිණි."

(i) ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පැවැති අනුරාධපුර පොළොන්නරු යුගවල දී

*A* - ගමික පාලකයා

*B* - රුහුණු දේශයේ පාලකයා

*C* - මායා රටේ පාලකයා

ඉහත *A*, *B* සහ *C* වලින් දක්වෙන එක් එක් පුද්ගලයා හැඳින් වූ නිල නාමය කුමක්දැ'යි දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත දක්වෙන ඒ ඒ කාර්යයන් සඳහා ගොඩනැංවූ ලද තාක්ෂණික නිර්මාණ මොනවාදැ'යි දී ඇති ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

*A* - වැවක අතිරික්ත ජලය පිට කිරීම

*B* - ප්‍රධාන වැවක ඉස්මත්තෙහි ඇති කුඩා දියපාරවල්වලින් වැටවී එකතු වන රොන්මඩ පාලනය කිරීම

*C* - ඇළක් මඟින් ජලය ගෙනයාම සඳහා ගඟ හරස් කොට ගල් කුට්ටි යොදා තැනූ බාධකය

*D* - වැවෙහි ජල පීඩනය සමනය කොට සොරොව්ව තුළින් ප්‍රධාන ඇළට ජලය නිකුත් කිරීම

**(දියවාඩී, මොනොල, රළපනාව, තුළුවැටි, අමුණ, සොරොව්ව, බිසෝ කොටුව, කළිඟු බැම්ම, පිටවාන)** (ලකුණු 04 යි)

(iii) ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පැවැති යුගයේ දී එහි මධ්‍ය පාලකයා වූ රජතුමාගෙන් රටවැසියන් කෙබඳු සේවාවන් බලාපොරොත්තු වූයේදැ'යි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) අපේ පැරණි වාරිමාර්ග ශිල්පීන් වාරිමාර්ග නිර්මාණය සඳහා භූ විෂමතා ලක්ෂණ උපයෝගී කරගත් ආකාරය නිදසුන් ඉදිරිපත් කරමින් පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(i) A - ගමික / පරුමක / ග්‍රාමභෝජක / ගමණි / [illegible] / [illegible]
B - ඇපා / රෝහණ භෝජක / [illegible]
C - මාපා

ලකුණු 1 X 3 - 03

(ii) A - පිටවාන
B - කුළුවැව
C - අමුණ
D - බිසෝකොටුව

ලකුණු 1 X 4 = 04

(iii)
- රට වැසියන් ආරක්ෂා කිරීම : අභ්‍යන්තර සතුරු බලවේගවලින් මෙන්ම බාහිර සතුරු බලවේගවලින් ද රටවැසියා ආරක්ෂා කර ගැනීම හා රටේ සාමය පවත්වා ගැනීම.
- ගොවිතැන් කටයුතු සඳහා වාරිකර්මාන්ත පහසුකම් සැලසීම : වැව් අමුණු ඉදිකරවීම, ඇළ මාර්ග ඉදිකරවීම ආදිය මගින් ගොවිතැනට ජලය සපයා දීමේ කාර්යයෙහි ප්‍රමුඛත්වය ගෙන කටයුතු කිරීම.
- ආගමික හා සංස්කෘතික කටයුතු දියුණු කිරීම : බුදු දහම ආරක්ෂා කිරීම, වෙහෙර විහාර ඉදි කරවා ආගමික කටයුතු සඳහා රට වැසියාට පහසුකම් සලසා දීම. විවිධ වූ කලාත්මක නිර්මාණ බිහි කිරීම සඳහා දක්ෂතා ඇති ශිල්පීන්ට ඒ සඳහා රාජ අනුග්‍රහය ලබා දීම හා ඔවුන්ගේ කාර්යයන් අගය කිරීම.
- රජතුමා පාලන කටයුතු කිරීමේදී මහා සංඝයා වහන්සේලාගේ මෙන් ම පුරෝහිත, සේනාපති සහ ඇමතිවරුන් ආදී ප්‍රභූන්ගේ උපදෙස් ලබාගෙන දසරාජ ධර්මය සැලකිල්ලට ගෙන පාලන කටයුතු මෙහෙය වීම රජුගේ කාර්යයක් විය.
- අධිකරණ පද්ධතියේ නායකයා වශයෙන් කටයුතු කිරීම.

මෙවැනි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කිරීම සඳහා : කරුණු දෙකකට ලකුණු 02
WWW.OLEVELAPI.COM
විස්තර කිරීමට ලකුණු 03
මුළු ලකුණු = 05

(iv) පැරණි වාරි ශිල්පීන් වාරිමාර්ග නිර්මාණය සඳහා භූ විෂමතා ලක්ෂණ උපයෝගී කරගත් ආකාරය :

- <u>වැව් තැනීම :</u>

- වියළි කලාපයේ පෝෂක භූ විෂමතා ලක්ෂණ උපයෝගී කොට ගෙන වාරි කර්මාන්ත ඉදි කිරීම. හෙල්වැටි වතිඳුම හා හෙල්වැටි අතරින් ගලා බසින ගංගා තිබීම. එසේ හෙල්වැටියක් කපාගෙන ගඟක් ගලා බසින ස්ථානයක ද එම හෙල්වැටියේ දෙපැත්ත සම්බන්ධ කර බැම්මක් බැඳ වැවක් තැනීම.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- වැවක් ඉදිකිරීමේ දී වැව් බැම්ම නිර්මාණය කිරීම සඳහා එකිනෙකට ලංව පිහිටි කඳු ගැට දෙකක් සම්බන්ධ කොට වැව නිර්මාණය කිරීම.

- වැව් බැම්ම නිර්මාණය කිරීමේ දී පොළොවේ පාෂාණ සංයුතිය ගැන ද සැළකිලිමත් වූ බව.
(නිද : මින්නේරිය වැව බැම්ම ස්ථානගත කර ඇත්තේ පොළොවේ ක්වාට්සයිට් පාෂාණ වැතිරීම මතය.)

- වැව් බැම්ම නිර්මාණය කිරීමේ දී පාෂාණ ස්ථරවල ආනතිය වැව ඇතුළට නැමී පවතින අවස්ථාවක් තෝරා ගැනීම නිසා වැව් බැම්මෙන් ජලය කාන්දු වීම වැළකේ.

- සමෝච්ඡ රේඛා වැතිරීම අනුව වැව් බැම්ම නිර්මාණය කිරීම.
(නිද : පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම)

- කඳු රහිත ප්‍රදේශවල භූමියේ පිහිටීම අනුව වැව් තනා තිබීම. (නිද : මන්නාරම් දිස්ත්‍රික්කයේ යෝධ වැවේ බැම්ම සැ. 07 ක් පමණ දිග වාපයක් ලෙස නිර්මාණයකර ඇත.

- සොරබොර වැවේ සොරොව්ව, පිහිටි කලුගල කපා නිර්මාණය කර තිබීම.

- <u>ඇළ මාර්ග නිර්මාණය කිරීම</u> :

- වයඹ කලාපීය තැනිතලාවේ බෑවුම අනුව ඇළවල් කැපීම සඳහා යෝග්‍ය භූ විෂමතාවක් තිබීම. ඒ අනුව භූමියේ හැඩතල අවබෝධ කොටගෙන දිගු ඇළ මාර්ග සකස් කිරීම.

- ඇළ මාර්ග නිර්මාණය කිරීමේදී සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙන යාම.
නිද : කලාවැවේ සිට යෝධ ඇළ දිගේ කිලෝමීටරයකට මී.මී. 95 ක බෑස්මක් යටතේ ජලය ගෙන යාම. ([illegible])

- <u>අමුණු ඉදිකිරීම</u> :

- ගංගාවක් දිගර ගැසෙමින් වක්කලමක හැඩයට ගලා බැසීම නිසා ජල පහරේ වේගය අඩුවන ස්ථාන තෝරා ගෙන ගඟ හරස්කර වේලි තැනීම.
(නිද : අංගමැඩිල්ලේ දී අඹන් ගඟ හරස් කර පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යාම. මහවැලි ගඟෙන් මිනිපේ ඇළට ජලය ලබාදීම.)

- භූමියේ බෑස්ම හා ජලවහන රටාවට අනුව ඒකාබද්ධ වූ වැව් හා ඇළ මාර්ග පද්ධතියක් නිර්මාණය කිරීම.
නිද : මල්වතුඔය සහ වලවේ ගං ආශ්‍රිත වැව් හා වාරි පද්ධතිය. (එල්ලංගාව)

මෙවැනි කරුණු තුනක් නිදසුන් සහිතව විස්තර කර තිබිය යුතුය.
නිදසුන් සහිතව එක් කරුණක් විස්තර කිරීමට ලකුණු දෙක බැගින් කරුණු තුනට

ලකුණු 2 X 3 = 06

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

03. අපේක්ෂණය : අනුරාධපුර රාජධානි සමය තුළ ලංකා ඉතිහාසයේ හටගත් දේශපාලන ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම.

3. "අනුරාධපුර රාජධානි සමය ලංකා ඉතිහාසයේ කැපී පෙනෙන දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් රැසක් සිදු වූ අවධියකි."

(i) අනුරාධපුරය රාජධානිය කරගත් රජවරුන් තිදෙනකු පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියා දක්වන්න.
**(කාවන්තිස්ස / ධාතුසේන / II පරාක්‍රමබාහු / I අග්බෝ / නිශ්ශංකමල්ල / V මිහිඳු)** (ලකුණු 03 යි)

(ii) *A* - පුළහත්ථ ඇතුළු දෙමළ ඉන්දිය ආක්‍රමණිකයන් පස්දෙනා ලංකාවට පැමිණි අවධියේ අනුරාධපුර රාජධානිය පාලනය කිරීම
*B* - ප්‍රථම වරට ලම්භකර්ණ පෙළපතට රාජ්‍ය බලය ලබා ගැනීම
*C* - ලංකාවේ විශාලතම ස්තූපය වූ ජේතවන දාගැබ ඉදිකරවීම
*D* - කන්තලේ හා ගිරිතලේ යන වැව් තැනවීම
ඉහත *A, B, C, D* වලින් දැක්වෙන එක් එක් කාර්යය හා සම්බන්ධ රජතුමා කවුරුන්දැයි අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) "වළගම්බා රාජ්‍ය සමය ආගමික වශයෙන් වැදගත් සිදුවීම් ගණනාවක් හටගත් කාලපරිච්ඡේදයකි." නිදසුන් **දෙකක්** දක්වමින් ඒ බව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) "මහසෙන් රජතුමා ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි කර්මාන්ත දියුණුවට වැදගත් මෙහෙයක් ඉටු කළ පාලකයෙකි." ඔහු විසින් කරවන ලද වැව් **දෙකක්** හා ඇළ මාර්ගයක් නම් කොට වාරිකර්මාන්ත දියුණුවට සිදු කළ සේවය විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) ධාතුසේන
I අග්බෝ
V මිහිඳු

ලකුණු 1 X 3 = 03

(ii)

| | | |
|---|---|---|
| A | - | වළගම්බා / වට්ට ගාමිණී අභය |
| B | - | වසභ |
| C | - | මහසෙන් |
| D | - | II අග්බෝ |

ලකුණු 1 X 4 = 04

WWW.OLEVELAPI.COM

(iii) වළගම්බා රාජ්‍ය සමයේ ආගමික වැදගත්කම් :

- <u>අභයගිරි විහාරය ඉදි කරවීම</u>. (සතුරන්ගෙන් බේරී පලා යද්දී රජුට අවමන් කළ ගිරි නම් නිගණ්ඨයා විසූ ආරාම පිහිටි ස්ථානයේ මෙම විහාරය ඉදිකරවන ලද බව සැලකේ.)

- <u>ශ්‍රී ලංකාවේ ප්‍රථම පෞද්ගලික ආරාම පූජාව සිදුවීම</u>. (සතුරන් පරදා ලංකා රාජ්‍යය නැවත ලබාගත් වළගම්බා රජු, සැඟව සිටියදී තමනට උපකාර කළ කුපික්කල මහාතිස්ස තෙරුන්ට අභිනවයෙන් තනන ලද අභයගිරි විහාරය පූජා කරන ලදී. එය ලංකාවේ සිදු වූ ප්‍රථම පෞද්ගලික ආරාම පූජාවයි.)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- ලංකාවේ ප්‍රථම වරට නිකාය භේදයක් හට ගැනීම. (වළගම්බා රජු විසින් අභයගිරි විහාරය පූජා කරනු ලැබූ කුපික්කල මහාතිස්ස තෙරුන් විනය කර්මයක් නිසා මහා විහාරයෙන් නෙරපා හරිනු ලැබුවෙකු වූ අතර උන් වහන්සේගේ ශිෂ්‍ය වහලමසුතිස්ස හිමි සමග පන්සියයක් භික්ෂූන් වහන්සේලා අභයගිරියෙහි වාසයට පැමිණ 'අභයගිරි නිකාය' පිහිටුවා ගත්හ. මේ නිසා ප්‍රථමවරට සංඝ භේදයක් හට ගැනීම හා නිකාය භේදයක් සිදුවීම ද විය.)

- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම. මෙතෙක් කල් මුඛ පරම්පරාගතව පැවතගෙන ආ ත්‍රිපිටක ධර්මය මාතලේ අළු විහාරයේ දී ග්‍රන්ථාරූඪ කිරීම සිදුවිය.

- ලෙන් විහාර රැසක් පිහිටුවාලීම. | [illegible]
වළගම්බා රජු සතුරන්ගෙන් බේරී සැඟව සිටීමට භාවිත කළ ගල් ලෙන් රැසක් නැවත ලංකා රාජ්‍යය ලබාගත් පසු ලෙන් විහාර බවට පත් කළේය. දඹුල්ල වැනි ලෙන් විහාර එසේ ගොඩ නගන ලද ඒවායි.

මෙවැනි කරුණු දෙකක් නිදසුන් සහිතව දැක්විය යුතුය.

| | |
|---|---|
| නිදසුන් දෙකට ලකුණු | 02 |
| විස්තර කිරීමට ලකුණු | 03 |
| මුළු ලකුණු = | 05 |

(iv) මහසෙන් රජුගෙන් වාරිකර්මාන්තවලට සිදු වූ සේවය :

- වැව් 16 ක් ඉදි කිරීම - මින්නේරිය, හුරුළු, කවුඩුල්ල, මහකනදරාව, මාගල්ල (මහාදාරගල්ල), මහගල්කඩවල වැනි වැව් රැසක් ඉදිකරවීම.

- ඇළහැර ඇළ විශාල කිරීම - ඇළහැර, මින්නේරි, කවුඩුලු ඒකාබද්ධ වාරිමාර්ග පද්ධතිය ඉදිකිරීම.

- පබ්බතන්ත ඇළ ඉදි කරවීම.

- මින්නේරිය වැව ඉදි කරවීමෙන් වාරිකර්මාන්ත ක්ෂේත්‍රයට ඉටු කළ මෙහෙය නිසා 'මින්නේරි දෙවියන්' ලෙස වැඳුම් පිදුම් ලැබීම.

| | |
|---|---|
| වැව් දෙකක් හා ඇළ මාර්ගයක් නම් කිරීමට ලකුණු | 03 |
| සේවය විස්තර කිරීමට ලකුණු | 03 |
| මුළු ලකුණු = | 06 |

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**04. අපේක්ෂණය :** **පොළොන්නරුව බිඳවැටීමෙන් පසු බිහිවූ රාජධානිවල දේශපාලන හා ආර්ථික රටාවේ වෙනස්වීම් පිළිබඳ දැනුම හා තුලනාත්මක අවබෝධය මැනීම.**

4. "පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු පැරණි ලංකාවේ රාජධානිවල, අගනුවරවල් වරින් වර වෙනස්වීම, දේශපාලන මෙන් ම ආර්ථික රටාවේ වෙනස්කම් කෙරෙහි ද බෙහෙවින් බලපෑ සිද්ධියක් විය."

(i) *A* - පළමුවැනි බුවනෙකබාහු

*B* - දෙවැනි බුවනෙකබාහු

*C* - හතරවැනි බුවනෙකබාහු

ඉහත නම් සඳහන් රජවරුන් රජකළ රාජධානි මොනවාද'යි වරහන් තුළ ඇති නම්වලින් තෝරා *A, B, C* අනුපිළිවෙළින් ලියා දක්වන්න. **(යාපහුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ)** (ලකුණු 03 යි)

(ii) *A* - කෝට්ටේ බලකොටුව ඉදිකළ පුද්ගලයා

*B* - ක්‍රි. ව. 1411 දී රයිගම් පාලනය කළ වීර අලකේශ්වර පරාජය කොට ඔහු සිරකරුවකු ලෙස චීනයට ගෙන ගිය චීන සෙන්පතියා

*C* - සිංහල හා දෙමළ ජනයා අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යාම නිසා වැසියන් අතර බොහෝ ජනප්‍රිය වූ යාපනයේ පාලකයා

*D* - යාපනයේ රාජධානිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන මූලාශ්‍ර ග්‍රන්ථය

ඉහත *A, B, C* වලින් දක්වෙන එක් එක් සිද්ධිය හා සම්බන්ධ පුද්ගලයාගේ නම ද *D* වලින් අසා ඇති මූලාශ්‍ර ග්‍රන්ථයෙහි නම ද පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) කෝට්ටේ රජකළ රජවරුන් අතුරෙන් හයවැනි පරාක්‍රමබාහු රජතුමා වඩාත් වැදගත් වන්නේ ඇයිද'යි කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) රජරට සිට නිරිත දෙසට රාජධානිය විතැන්වීමත් සමඟ ආර්ථික රටාව ද වෙනස් වූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) A - යාපහුව

B - කුරුණෑගල

C - ගම්පොල

**ලකුණු 1 X 3 = 03**

WWW.OLEVELAPI.COM

(ii) A - නිශ්ශංක අලගක්කෝනාර / නිශ්ශංක අලකේශ්වර

B - චෙං හෝ

C - වරෝදය

D - යාල්පාන වෛපවමාලෙයි.

**ලකුණු 1 X 4 = 04**

(iii) කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය.

- අවසන්වරට මුළු ලංකාවම එක්සේසත් කළ රජතුමා වීම. /
- යාපනේ රාජ්‍යය අඥා ගෙන වන්නි ප්‍රදේශවල නායකවරු අවනත කොට මලය ප්‍රදේශයේ හටගත් කැරලි මර්ධනය කොට රටේ සාමකාමී පාලනයක් ඇති කිරීම.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



- රටේ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම.

- විදේශයන්හි ද ආධිපත්‍යය පැතිරවීම - වෙළෙඳ ගනුදෙනුවක් මුල්කරගෙන දකුණු ඉන්දියාවේ අතිවිරරාම් පට්ටන ආක්‍රමණය කිරීම, විජය නගර අධිරාජ්‍යයේ තොටුපලක් ආක්‍රමණය කිරීම.

- සාහිත්‍යයේ උන්නතියට කළ සේවය - සාහිත්‍යයේ ස්වර්ණමය අවධිය බවට පත්වීම, ඒ සඳහා හය වන පරාක්‍රමබාහු රජුගෙන් ලද අනුග්‍රහය, පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුව, සිය මෑණියන් සිහිවීම සඳහා පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන කරවීම.

- පද්‍යාමය සිංහල 'රුවන්මල' නිඝණ්ඩුව රජතුමා විසින් රචිත ග්‍රන්ථයක් බව කියනු ලැබේ.

මෙවැනි කරුණු දෙකක් ඇසුරින් විස්තර කිරීමට

| | | |
|---|---|---|
| කරුණු දෙකට | ලකුණු | 02 |
| විස්තර කිරීමට | ලකුණු | 03 |
| | | 05 |

(iv) රජරට සිට නිරිත දෙසට රාජධානිය විතැන්වීමත් සමඟ ආර්ථික රටාවද වෙනස් වූ ආකාරය :

- රජරට ප්‍රදේශයේ සිට නිරිත දෙසට රාජධානි විතැන්වීමත් සමඟ නව භූගෝලීය පරිසරයකට මුහුණ දීමට ජනතාවට සිදුවීම.

- මහවැව් හා වාරිමාර්ග ඉදිකිරීමට රජවරුන් උනන්දු නොවීම හා තෙත් කලාපීය ප්‍රදේශ නිසා ඒවා එතරම් අවශ්‍ය නොවීම, කෘෂිකාර්මික කටයුතුවලට අහස්දිය යොදා ගැනීම.

- වී ප්‍රධාන වගාව

- ජලය හිඟ ප්‍රදේශවල හේන් වගාව

WWW.OLEVELAPI.COM

- මද උස්බිම්වල පොල්, පුවක්, ගම්මිරිස්, බුලත් වැනි බෝග වගාව

- තෙත් කලාපීය වෙරළබඩ පොල් වගාව ප්‍රචලිත විය.

- තෙත් කලාපයේ වනගතව වැවුන කුරුඳු වෙළෙඳ බෝගයක් ලෙස වැදගත් වීම.

- වෙළෙඳාම ප්‍රචලිත වීම - කුරුඳු, පුවක්, ගම්මිරිස්, සාදික්කා හා එනසාල් ද මුතු, මැණික්, ඇතුන් හා ඇත්දළ අපනයන භාණ්ඩ විය.

- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පැවති ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව වාණිජ්‍ය නිර්යාත ආර්ථික රටාවකට පරිවර්තනය ආරම්භ වීම දක්නට ලැබිණ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- ඉන්දියාව, අරාබිය, චීනය, පර්සියාව හා ඊජිප්තුව සමඟ වෙළෙඳ සබඳතා වර්ධනය වීම. (ඉන්දියාවෙන් සහිකාව, චීනයෙන් පිඟන් භාණ්ඩ)

- විදේශ වෙළෙඳාම රජුගේ මූලිකත්වයෙන් සංවිධානය වීම.

- අභ්‍යන්තර වෙළෙඳාම දියුණු වූ බව - 'කුරුණෑගල විස්තරය' නම් පුස්කොළ පොතේ එන තොරතුරුවලින් හෙළිවීම.

- කාසි භාවිතය ප්‍රචලිත වූ බව.

මෙවැනි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කිරීම.

| | | |
|---|---|---|
| කරුණු තුනට | ලකුණු | 03 |
| විස්තරට | ලකුණු | 03 |
| | | 06 |

**05. අපේක්ෂණය : පෘතුගීසි හා ලන්දේසි බලය හමුවේ දේශීය පාලකයන් ක්‍රියාත්මක වූ ආකාරය තුලනාත්මකව විමසීමේ හැකියාව පිරික්සීම.**

5. "ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි බලය ඇතැම් අවස්ථාවල දී සුළු ප්‍රදේශයකට සීමා කිරීමට සමත් වුව ද බාහිර උපකාර නොලබා ඔවුන්ගේ ආධිපත්‍යය මුළුමනින් ම නැතිකර දැමීමට දේශීය පාලකයෝ අපොහොසත් වූහ."

(i) *A* - ක්‍රි. ව. 1505 දී ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු පෘතුගීසි කණ්ඩායම පැමිණෙන විට කෝට්ටේ රජකළ රජතුමා

*B* - ක්‍රි. ව. 1602 දී ජෝරිස් වැන් ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතිකයා ලංකාවට පැමිණෙන විට කන්ද උඩරට රජකළ රජතුමා

*C* - ක්‍රි. ව. 1762 දී ජෝන් පයිබස් නම් ඉංග්‍රීසි ජාතිකයා දූත මෙහෙවරක් සඳහා ලංකාවට පැමිණෙන විට කන්ද උඩරට රජකළ රජතුමා

ඉහත *A*, *B* සහ *C* වලින් සඳහන් වන එක් එක් රජතුමාගේ නම කුමක්දැයි පහත වරහන් තුළින් තෝරා පිළිවෙළින් ලියා දක්වන්න.

**(දොන් ජුවන් ධර්මපාල / නවවැනි ධර්ම පරාක්‍රමබාහු / පළමුවැනි විමලධර්මසූරිය / දෙවැනි රාජසිංහ / කීර්ති ශ්‍රී රාජසිංහ / ශ්‍රී වික්‍රම රාජසිංහ)** *(ලකුණු 03 යි)*

(ii) *A* - උඩරට රාජධානියට ආක්‍රමණ එල්ල කළ පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරුන් **දෙදෙනකු** නම් කරන්න.

*B* - ලංකාවේ මුහුදුබඩ පළාත්වල පාලනය ගෙන ගිය ලන්දේසි ආණ්ඩුකාරවරුන් **දෙදෙනකු** නම් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි බලය මුළුමනින් ම නැතිකර දැමීමට කෝට්ටේ හා සීතාවක පාලකයන්ට නොහැකි වූයේ ඇයිදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

(iv) ක්‍රි. ව. 1766 දී ලන්දේසීන් සමඟ කීර්ති ශ්‍රී රාජසිංහ රජු අත්සන් කළ ගිවිසුම උඩරට රාජ්‍යයට අවාසිදායක වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(i) A - නව වන ධර්ම පරාක්‍රමබාහු /

B - පළමුවන විමලධර්මසූරිය /

C - කීර්ති ශ්‍රී රාජසිංහ

( ලකුණු 1 X 3 = 03 යි )

(ii) A - පේරෝ ලොපෙස් ද සූසා/දොන් ජෙරනිමෝ ද අසවෙදු/කොන්ස්ටන්ටයින් ද සා/ දියෝගෝ ද මෙලෝ කැස්ත්‍රෝ

B - වැන් එක් / වැන් ගුන්ස් / රයික්ලොෆ් / වැන් ගුන්ස් / වැන් එන්ගල් බෙක් / විලෙම් ෆල්ක්. ලෝරන්ස් පිල්. වැන් ඉමෝෆ්.

( ලකුණු 1 X 4 = 04 යි )

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii)
- ප්‍රබල නාවුක හමුදාවක් නොමැතිවීම.
- පෘතුගීසින්ගේ යුද හමුදා ශක්තිය.
- දේශීය පාලකයන් අතර පැවති අසමගිය.
- පෘතුගීසින් සතුව තිබූ යුද අවි බලය.
- ඇතැම් දේශීය ප්‍රභූන්ගෙන් (කෝට්ටේ) පෘතුගීසින්ට ලැබුණු සහාය.
- කෝට්ටේ පාලකයන් වශයෙන් පෘතුගීසින් බලය තහවුරු කර ගැනීම.

( ලකුණු 2 +3 = 05 යි )

(iv)
- වරාය පිළිබඳ අයිතිය ගිවිසුම අනුව ලන්දේසීන්ට ලැබීම.
- මුහුදුබඩ ගව්වක් පමණ බිම් තීරුවක් ලන්දේසීන්ට පවරාදීමට සිදුවීම.
- කුරුඳු පිළිබඳ වෙළෙඳ ඒකාධිකාරය ලන්දේසීන්ට ලැබීම නිසා සිංහල රජුන්ට ලැබිය යුතු ආදායම නොලැබී යාම.
- ගිවිසුම අනුව උඩරට හා වෙරළබඩ ප්‍රදේශ අතර සිදුවූ වෙළෙඳාමෙන් උඩරට රජුන්ට අවාසි සිදුවීම (ලුණු වෙළෙඳාම).
- [illegible]

( ලකුණු 3 +3 = 06 යි )

06. අපේක්ෂණය : බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා වූ ආණ්ඩුක්‍රම විකාශය හා ඒවායේ මූලික ලක්ෂණ පිළිබඳ සංසන්දනාත්මක දැනුම හා අවබෝධය පිරික්සීම.

WWW.OLEVELAPI.COM

6. (i) පහත දැක්වෙන කරුණු හා සම්බන්ධ පුද්ගලයන් *A*, *B*, *C* අනුපිළිවෙළින් නම් කරන්න.

*A* - ක්‍රි. ව. 1910 දී උගත් ලාංකිකයන්ගේ ඡන්දයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වූ තැනැත්තා

*B* - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම අගමැතිවරයා

*C* - ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා (ලකුණු 03 යි)

(ii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා අනුව ලංකාවේ සිදුකරන ලද පරිපාලනමය වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ලබා දුන් ආණ්ඩුක්‍රමය අර්ධ වගකීම් සහිත පාලනයක් ලෙස සලකන්නේ ඇයිද'යි හේතු **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ක්‍රි. ව. 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් නව නියෝජන ක්‍රම අත සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(i) A - ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්

B - මහාමාත්‍ය ඩී.එස්. සේනානායක

C - ජේ.ආර්. ජයවර්ධන

( ලකුණු 1 X 3 = 03 යි )

(ii)
- උඩරට පහතරට වශයෙන් වෙන් වෙන්ව තිබූ පරිපාලන ඒකක දෙක වෙනුවට එක් පාලන ක්‍රමයක් ඇති කිරීම.
- ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදීම.
- සිවිල් සේවාව සංශෝධනය කිරීම.
- පරිපාලන සේවයට දේශීය ජනතාව යොදවා ගැනීම සඳහා ඉඩකඩ සැලසීම.

( ලකුණු 2 X 2 = 04 යි )

(iii)
- පරිපාලනය, මුදල් කටයුතු හා අධිකරණය පිළිබඳ බලතල යුරෝපීය රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු වෙත පවරා තිබීම.
- කාරක සභා හතක් යටතේ අනෙකුත් කාර්යයන් දේශීය නියෝජිතයන්ට පැවරීම.
- ආණ්ඩුකාරයා බොහෝ විට යුරෝපීය රාජ්‍ය නිලධරයන් සමඟ පක්ෂග්‍රාහීව කටයුතු කිරීම.
- ආණ්ඩුකාරයා සතුවූ විශේෂ බලතල

WWW.OLEVELAPI.COM

( ලකුණු 2 + 3 = 05 යි )

(iv)
- ජනාධිපතිවරණය.
- සමානුපාතික නියෝජනය.
- ජනමත විචාරණය.

මෙම නියෝජන ක්‍රම ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් දැක්වීම ප්‍රමාණවත්ය.

( ලකුණු 3 + 3 = 06 යි )

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

07. අපේක්ෂණය : දේශපාලන, ආර්ථික හා සමාජ යන අංශ ඔස්සේ වෛදික යුගය විශ්ලේෂණාත්මකව ඇගයීමේ හැකියාව පිරික්සීම.

III කොටස

7. "වෛදික යුගය ඉන්දියානු ඉතිහාසයේ දේශපාලන, ආර්ථික හා සමාජ යන අංශවල නව ආරම්භයක් සේ සැලකිය හැකි ය."

(i) *A* - ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්යයන්ගේ මුල්ම වාසභූමිය ලෙස සැලකෙන ප්‍රදේශය

*B* - ඉන්දියාවට බහුල වශයෙන් සංක්‍රමණ හා ආක්‍රමණ එල්ල වූ වායඹදිග පිහිටි දුර්ග මාර්ගය

*C* - ආර්ය ජනාවාස දකුණු ඉන්දියානු ප්‍රදේශ කරා ව්‍යාප්තවීමේ දී බාධාවක් ව පැවැති කඳුවැටිය.

ඉහත *A*, *B* සහ *C* වලට අදාළ පිළිතුරු පහත ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

(ස්ටෙප්ස්, ඛයිබර්, බෝලාන්, වින්ධ්‍යා, හින්දුකුෂ්, සාත්පුරා) (ලකුණු 03 යි)

(ii) ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්ය ජනපදිකයන් පිළිබඳ ව තොරතුරු දැනගත හැකි වෛදික ග්‍රන්ථ හතර නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ආර්යයන් ක්‍රි. පූ. හයවැනි සියවස පමණ වන විට ඉන්දියාව තුළ ව්‍යාප්ත වූ ආකාරය කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) වෛදික යුගයේ පැවැති ඉන්දියානු ජනජීවිතය පහත *A* හා *B* යන අංශ යටතේ පැහැදිලි කරන්න.

*A* - ආර්ථිකය

*B* - සමාජ සංවිධානය (ලකුණු 08 යි)

(i) A - ස්ටෙප්ස්

B - ඛයිබර්

C - වින්ධ්‍යා

( ලකුණු 1 X 3 = 03 යි )

(ii) ඍග්, යජුර්, සාම, අථර්වන්

( ලකුණු 1 X 4 = 04 යි )

(iii)
- මුලින්ම සප්ත සින්දු ප්‍රදේශයේ ජනාවාස පිහිටුවා ගැනීම.
- ඉන් පසුව ගංගානම් ගංගාධාර ප්‍රදේශය කරා ක්‍රමයෙන් ව්‍යාප්ත වීම.
- වින්ධ්‍යා කඳු වැටියෙන් දකුණට ද ව්‍යාප්ත වූ බව.
- ක්‍රි.පූර්ව හයවන සියවස පමණ වන විට ජනපද දහසයක් යටතේ මෙම ව්‍යාප්තිය දැකිය හැකිය.

( ලකුණු 05 යි )

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) A - ආර්ථිකය :

- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය වීම
  - * ධාන්‍ය වගාව (තිරිඟු, බාර්ලි, වී)
  - * සත්ත්ව පාලනය - (ගවයන් ඇති කිරීම ප්‍රධාන තැනක් ගැනීම.)
- ග්‍රාමීය මට්ටමින් විවිධ කර්මාන්ත සංවිධානය වීම. (ආභරණ, ගොවි උපකරණ, මැටි භාණ්ඩ, .............)
- වෙළෙඳාම ද යම් ප්‍රමාණයකට වර්ධනය වී තිබීම. (භාණ්ඩ හුවමාරුව, සීමිත මුදල් භාවිතය)
- භාණ්ඩ පරිවහනය සඳහා රට තුළ ගංගා හා ගොඩබිම් මාර්ග භාවිතය.

B - සමාජ සංවිධානය :

- න්‍යෂ්ටික සමාජ ඒකකය පවුල වීම.
- පියා පවුලේ ප්‍රධානියා වීම.
- පවුල් කිහිපයක් එකතු වී ගෝත්‍ර සංවිධානය වීම හා පසුව එය රාජ්‍යත්වය පදනම් කරගත් සමාජ සංවිධානයක් බවට පත් වීම.
- පශ්චාත් වෛදික යුගයේ දී වර්ණ වශයෙන් (කුල වශයෙන්) සමාජය බෙදී යාම.
- සංස්කෘතිකාංග සමාජය තුළ වර්ධනය වීම (විවිධ දර්ශන වාද, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්, සිරිත් විරිත්, උත්සව, ක්‍රීඩා ...............)

( ලකුණු 3 +3 = 06 යි )

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

08. **අපේක්ෂණය : ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනය හා ඉන්දියානු නිදහස් ව්‍යාපාරය පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය විමසීම.**

8. "බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ අනුගමනය කළ ප්‍රතිපත්ති ඉන්දියානුවන් තුළ බ්‍රිතාන්‍ය විරෝධී ආකල්ප ඉස්මතුවීම කෙරෙහි සඳින් බලපෑ අතර ඉන්දියානු නිදහස් ව්‍යාපාරය සංවිධානාත්මක ව ගොඩනැඟීමට ද ඉවහල් විය."

(i) *A* - 1857 මැයි 10

*B* - 1947 අගෝස්තු 14

*C* - 1950 ජනවාරි 26

ඉහත සඳහන් දින තුන ඉන්දියා ඉතිහාසයේ වැදගත් වීමට හේතු වූ සිදුවීම් **තුන** පහත වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

**(වෙන ම රාජ්‍යයක් ලෙස පකිස්ථානය බිහිවීම / සිපෝයි කැරැල්ලේ ආරම්භය / ඉන්දියානු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම / ඉන්දියාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් නිදහස ලැබීම / ඉන්දියානු ජාතික කොන්ග්‍රසය පිහිටුවීම)** *(ලකුණු 03 යි)*

(ii) *A* - ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ මධ්‍යස්ථ මතධාරී නායකයන් **දෙදෙනකු** ද

*B* - දඩිමතධාරී නායකයන් **දෙදෙනකු** ද *A*, *B* අනුපිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධව ඉන්දියාව තුළ සංවිධානාත්මක ජාතික ව්‍යාපාරයක් ආරම්භ වීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 08 යි)*

(iv) ඉන්දියානු නිදහස් සටනේ ක්‍රියාකාරී නායකයකු ලෙස මහත්මා ගාන්ධිතුමාගේ දායකත්වය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(i) A - **සිපෝයි කැරැල්ලේ ආරම්භය.**

B - **වෙනම රාජ්‍යයක් ලෙස පකිස්ථානය බිහිවීම.**

C - **ඉන්දියානු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම.**

**( ලකුණු 1 X 3 = 03 යි )**

(ii) A - **මධ්‍යස්ථමතධාරීන් දෙදෙනෙක් : දාදාභායි නවරෝජි/ගෝපාල් ක්‍රිෂ්ණ ගෝඛලේ/ සුරේන්ද්‍රනාත් බැනර්ජි.** ([illegible])

**මෙයින් දෙදෙනෙකු නම් කිරීම ලකුණු 02 යි.**

B **සටන්කාමී නායකයන් දෙදෙනෙක් :**

**බාල් ගංගාධර් තිලක් / බිපින් චන්ද්‍රපෝල් / ලාලා ලජ්පත්රායි.**

**මින් දෙදෙනෙකු නම් කිරීම ලකුණු 02 යි.**

**ලකුණු 2 +2 = 04 යි**

(iii) **බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධව ඉන්දියාව තුළ සංවිධානාත්මක ජාතික ව්‍යාපාරයක් ආරම්භ වීමට බලපෑ හේතු :**

- **බ්‍රිතාන්‍යයන් ඉන්දියානුවන් කෙරෙහි අනුගමනය කළ ප්‍රතිපත්ති මෙයට හේතු වූ බව**

  - **කාර්මිකාර්මික ප්‍රතිපත්තිය - අධික ඉඩම් බදු හා ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථිකය බිඳ වැටීම නිසා ජනතාව පීඩනයට පත්වීම.**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- කර්මාන්ත
  ඉන්දියාවේ සම්පත් තම රටට ගෙන යාම හා කර්මාන්ත සඳහා ව්‍යාපාරික පන්තිය උනන්දු කර වූ අතර ඉන්දියානුවන් අඩු වැටුපට කම්කරුවන් ලෙස යොදා ගැනීම - ශ්‍රමය සූරා කෑම, දේශීය කර්මාන්තවලට අනුග්‍රහ නොදැක්වීම නිසා ඒවා පිරිහියාම.

- සාගත
  ඉන්දියාවේ වරින් වර හටගත් සාගතවලින් ඉන්දියානුවන් ලක්ෂ ගණනින් මියයාම හා ඔවුන් ඉන් මුදා ගැනීමට බ්‍රිතාන්‍යයන් ප්‍රමාණවත් සැළකිල්ලක් නොදැක්වීම.
  නිද : බෙංගාලයේ සාගතයකින් ලක්ෂ 35 ක් පමණ මියයාම.

- බටහිර අධ්‍යාපන ක්‍රමය :
  බ්‍රිතාන්‍යයන් සිය පරිපාලන, දේශපාලන හා සංස්කෘතික අවශ්‍යතා ඉටු කර ගැනීමට ඉංග්‍රීසි අධ්‍යාපනය ඉන්දියාවේ ව්‍යාප්ත කළ ද ඉන් ඇති වූයේ ඊට විරුද්ධ ප්‍රතිඵලයකි.

- ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා යුරෝපා රටවල පැවති ජාතිකානුරාගී ව්‍යාපාර පිලිබඳව අවබෝධයක් ඉන්දියානුවන්ට ලැබීම.

- විවිධ භාෂා කථා කරන ඉන්දියානුවන් අතර සමීප සබඳතා ඇති කිරීමට හේතු වූ අතර එමගින් ඉන්දියානුවන්ට අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව ලැබීම.

- බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ යටිතල පහසුකම් දියුණු කිරීම නිසා හටගත් ඒකාබද්ධතාව ඉන්දියානුවන් එකම ජාතියක් සේ සිතීමට රුකුල් දීම.

- බ්‍රිතාන්‍යයන්ගේ උද්දච්ච බව, ඉන්දියානුවන් කොන් කිරීම, නීතිය ඉදිරියේ ඉන්දියානුවන් සමාන නොවීම.

- බ්‍රිතාන්‍යයන් ඉන්දියාව තුළ අනුගමනය කළ මර්දනකාරී නීති, රීති.

- ඉන්දියාවේ පැවති පැරණි ශ්‍රී විභූතිය පිළිබඳ තොරතුරු හෙළිවීම නිසා ඉන්දියානුවන් තුළ අභිමානයක් ඇති වීම.

WWW.OLEVELAPI.COM

මෙවැනි හේතු දෙකක් විස්තර කර තිබිය යුතුය.

| | | |
|---|---|---|
| හේතු දෙක නම් කිරීමට | ලකුණු | 02 |
| විස්තර කිරීමට | ලකුණු | 03 |
| මුළු | ලකුණු | 05 |

(iv) ඉන්දියානු නිදහස් සටනට මහත්මා ගාන්ධි තුමාගේ දායකත්වය :

- සත්‍යග්‍රහ ව්‍යාපාර
  - බ්‍රිතාන්‍ය යටත් විජිතවල කම්කරුවන් ලෙස සේවය කිරීමට ඉන්දියානුවන්ගෙන් ලබාගෙන තිබූ පොරොන්දු පත්‍ර අවලංගු කිරීම සඳහා සත්‍යග්‍රහයන් පැවැත්වීම - ඉන්ඩිගෝ-වගා කරන්නන් වෙනුවෙන්

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- සහයෝගිතා වර්ජන ව්‍යාපාරය
  - උසාවි, ව්‍යවස්ථාදායක මණ්ඩල, අධ්‍යාපන ආයතන හා බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත භාණ්ඩ වර්ජනය කිරීම.
  - බ්‍රිතාන්‍යයන් විසින් පිරිනමනු ලබන නම්බුනාම තාන්න මාන්න වර්ජනය.
  - දේශීය භාණ්ඩ නිෂ්පාදනය හා (භාවිතය) උනන්දු කරවීම.
  - හින්දු මුස්ලිම් මිත්‍රත්වය වර්ධනය සඳහා කටයුතු කිරීම.
  - [illegible]

- සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය
  - දණ්ඩි පාගමන (ලුණු බද්ද පිළිබඳ නීතිය කඩ කිරීම සඳහා සබර්මතී ආශ්‍රමයේ සිට දණ්ඩි වෙරළ දක්වා)

- 'ඉන්දියාවෙන් ඉවත් වෙනු' ව්‍යාපාරය

- ඉන්දියානු ජාතික කොංග්‍රසය හා මුස්ලිම් සංගමය සමඟ එකඟතාවක් ඇති කිරීමට 'සිම්ලා' සම්මේලනය සංවිධානය කිරීම.

මෙවැනි කරුණු තුනක් විස්තර කිරීම.

| | | |
|---|---|---|
| කරුණු 03 ට | ලකුණු | 03 |
| විස්තර කිරීමට | ලකුණු | 03 |
| | ලකුණු | 06 |

09. අපේක්ෂණය : එංගලන්තයෙන් ආරම්භ වූ කාර්මික විප්ලවය ලොව බොහෝ රටවල දේශපාලන ආර්ථික හා සාමාජික ක්ෂේත්‍ර කෙරෙහි ඇති කරන ලද බලපෑම විමර්ශනාත්මක ව විග්‍රහ කිරීමේ හැකියාව මැනීම.

WWW.OLEVELAPI.COM

9. "එංගලන්තයේ ආරම්භ වූ කාර්මික විප්ලවය කෙටි කාලයක දී ලොව බොහෝ රටවලට ව්‍යාප්ත වූ අතර එය දේශපාලන, ආර්ථික හා සාමාජික ක්ෂේත්‍ර කෙරෙහි ඉමහත් බලපෑමක් ද ඇති කෙළේ ය."

(i) එංගලන්තයේ ආරම්භ වූ කාර්මික විප්ලවය කෙටි කලක දී යුරෝපයේ සෙසු රටවලට ද ව්‍යාප්ත විය. එසේ ව්‍යාප්ත වූ යුරෝපා රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලව සමයේ නිපදවන ලද නව නිපැයුම් කිහිපයක් *A*, *B*, *C* හා *D* යටතේ දක්වේ. ඒවා නිපදවන ලද පුද්ගලයන්ගේ නම් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

*A* - අහස් යානය

*B* - රෙදි මැසීමේ යන්ත්‍රය

*C* - වාෂ්ප දුම්රිය එන්ජිම

*D* - මෝටර් රථය

**(ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්, රයිට් සහෝදරයෝ, ජෝර්ජ් ස්ටීවන්සන්, ජේම්ස් වොට්, එලියස් හෝවේ, ඩේම්ලර්, ජෝන් මැකඩම්, සැමුවෙල් මෝර්ස්)** (ලකුණු 04 යි)

(iii) දහනවවැනි සියවසේ දී යුරෝපා රටවල කාර්මීකරණය පැතිරීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය නිසා ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

- 23 -

(i) ප්‍රංශය, ජර්මනිය, බෙල්ජියම, ඔස්ට්‍රියාව, හංගේරියාව, ප්‍රශියාව

මේ රටවලින් තුනක් නම් කිරීමට ( ලකුණු 1 X 3 = 03 යි )

(ii) A - රයිට් සහෝදරයෝ

B - විලියම් හෝවේ-

C - ජෝර්ජ් ස්ටීවන්සන්

D - ඩෙම්ලර්

( ලකුණු 1 X 4 = 04 යි )

(iii) 19 වැනි සියවසේ යුරෝපා රටවල කාර්මීකරණය පැතිරීමට බලපෑ හේතු :

- යුරෝපා මහාද්වීපය තුළ ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවීම.
- යුරෝපා මහාද්වීපය තුළ ගමනාගමනය හා ප්‍රවාහන කටයුතුවල වර්ධනය.
- වාණිජ කටයුතු ව්‍යාප්තියට සුදුසු පරිදි නීති හා පරිපාලන ප්‍රතිසංස්කරණ සිදු කිරීම.
- කර්මාන්තවලට හා මාර්ග ඉදි කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
- යුද සමයේ එංගලන්තය පැනවූ වෙළෙඳ බාධක නිසා සප රෙදි ආනයනය අඩපන වීම යුරෝපයේ ලෝම රෙදි සඳහා ඉල්ලුම වැඩි වීමට හේතු වීම.
- තීරු බදු ඉවත් කිරීම නිසා පහසුවෙන් අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.
- ප්‍රංශයේ හා ජර්මනියේ ගල් අඟුරු සොයා ගැනීම.
- යුරෝපා රටවල් බොහොමයක් සතු ව යටත් විජිත පැවතීම නිසා අමුද්‍රව්‍ය ලබා ගැනීමත් නිමි භාණ්ඩ වෙළෙඳාමත් පහසුවීම.

මෙවැනි හේතු දෙකක් විස්තර කර තිබිය යුතුය.

| | | |
|---|---|---|
| හේතු දෙක නම් කිරීමට | ලකුණු | 02 |
| විස්තර කිරීමට | ලකුණු | 03 |
| මුළු | ලකුණු | 05 |

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iv) කාර්මික විප්ලවය නිසා ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම්.

<u>ආර්ථික ක්ෂේත්‍රය :</u>

- කාර්මික නිෂ්පාදන පුළුල් වීම.
- වාණිජ කටයුතු ආර්ථික ක්ෂේත්‍රයේ පෙරමුණ ගැනීම.
- ආනයන අපනයන ආර්ථිකයන් වර්ධනය වීම.
- කෘෂි නිෂ්පාදන කටයුතු කාර්මීකරණය වී ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන බහුලව වෙළෙඳපොළට ඒම.
- සුළු ඉඩම් හිමි ගොවීන්ට සිය ආර්ථික කටයුතු කරගත නොහැකි වීම නිසා කම්හල්වල ශ්‍රමිකයන් ලෙස නගරයට ඇදී ඒම.
- පුළුල් වූ වෙළෙඳ කටයුතු සඳහා මුදල් ආයෝජනය කිරීමට ව්‍යාපාරික සංවිධාන බිහි වීම.
- බහු ජාතික සමාගම් බිහි වීම.
- මුදල් හා බැංකු කටයුතුවල දියුණුව.

<u>සමාජයීය ක්ෂේත්‍රය :</u>

- කාර්මීකරණය සමග නගර සංඛ්‍යාව වැඩි වීම හා විශාල නගර බිහිවීම.
- කර්මාන්තශාලා බිහිවීම නිසා ඒවායේ සේවයට පැමිණි ස්ත්‍රී පුරුෂ හා ළමා ශ්‍රමිකයින් කම්හල් අසල පදිංචි වීම.
- මේ නිසා කම්හල් අවට ප්‍රදේශ ජනාකීර්ණ නගර බවට පත්වීම.
- නගර බලාපොරොත්තු නොදෙන තරමට ජනාකීර්ණ වූ අතර ඒවාට මූලික පහසුකම් සැපයීම අඩු වේගයකින් සිදුවීම. (නිද : ජන සංඛ්‍යාව 20% කින් වැඩි වුව ද නිවාස ඉදිකිරීම වර්ධනය වූයේ 11.5% කිනි.)
- පන්ති සමාජයක් බිහිවීම. - (ධන හිමියන් හා නිර්ධන පන්තික ශ්‍රමිකයන් ලෙස ද ධන හිමියන් රදළ ප්‍රභූන් හා මධ්‍යම පන්තිය ලෙස ද වෙන් වීම.)
- නිර්ධන පන්තිකයන් වූ ශ්‍රමිකයන් අඩු ආදායම් ලාභීන් වීම.
  එම පවුල්වල ගැහැණු පිරිමි දෙපක්ෂයත් දරුවනුත් රැකියාවල නිරත වීම.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- දෙමව්පියන් රැකියාවලට යාම නිසා දරුවන් විවිධ අපචාරවලට ගොදුරු වීම.
- කම්කරුවන්ගේ ජීවිතවල සුරක්ෂිත බවක් නොවීම.
- සමාජ විරෝධී ක්‍රියා බහුල වීම.
- ජන ජීවිතයේ කටයුතු පහසුවීම.
- පරිසර දූෂණය ඇතිවීම.

( ලකුණු 3 +3 = 06 යි )

10. **අපේක්ෂණය :** ලෝක මහා සංග්‍රාමවලින් පසුව නිර්මාණය වූ ලෝකය දෙස විශ්ලේෂණාත්මක විග්‍රහ කිරීමේ හැකියාව පිරික්සීම.

10. "ලෝක සංග්‍රාමවලින් පසුව බිහි වූ සාමය සඳහා වූ ජාත්‍යන්තර සංවිධාන රටවල් අතර ඇති වූ ගැටුම් බොහොමයක් සමථයකට පත් කිරීමට සමත් වුව ද ප්‍රධාන බල කඳවුරු අතර පැවැති බල අරගලය නිසා ඇතැම් සාම ප්‍රයත්න අසාර්ථක විය."

(i) *A* - පළමුවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක සාමය උදෙසා පිහිටුවාගත් සංවිධානය ද

*B* - දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක සාමය උදෙසා පිහිටුවාගත් සංවිධානය ද

*C* - ප්‍රබල ඊශ්‍රායෙල් රහස් ඔත්තුසේවාව ද,

අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ධනවාදී පිලට නායකත්වය දුන් රටවල් **දෙකක්** ද

*B* - සමාජවාදී පිලට නායකත්වය දුන් රටවල් **දෙකක්** ද නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ගත වූ දශක දෙක තුළ එකිනෙකට විරුද්ධව බල කඳවුරු දෙක සෘජුව ම අවිගැටුම්කට යොමු නොවුව ද ඝට්ටනකර බල අරගලයක් පැවැති බව සනාථ කරන සිද්ධීන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව, දේශපාලනමය වශයෙන් ලෝකයේ ඇති වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

(i) A - ජාතීන්ගේ සංගමය

B - එක්සත් ජාතීන්ගේ සංවිධානය

C - මොසාඩ්

( ලකුණු 1 X 3 = 03 යි )

(ii) A - ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය (බටහිර)

B - සෝවියට් දේශය, චීනය

( ලකුණු 2 +2 = 04 යි )

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(iii)

- බර්ලින් ප්‍රශ්නය
- කොරියන් අර්බුදය
- සූවස් අර්බුදය,
- කියුබානු මිසයිල අර්බුදය

මෙම සිද්ධීන් සරලව විස්තර කිරීම ප්‍රමාණවත්ය.

( ලකුණු 2 +3 = 05 යි )

(iv)

- එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම.
- නැගෙනහිර යුරෝපා රටවල කොමියුනිස්ට් පාලනයන් ඇතිවීම.
- ධනවාදී හා සමාජවාදී යනුවෙන් බල කඳවුරු දෙකක් බිහිවීම.
- යටත් විජිතව පැවති රටවල් නිදහස් වීම.
- නේටෝ, වෝර්සෝ වැනි ආරක්ෂක සංවිධාන බිහිවීම.
- ඊශ්‍රායලය වැනි නව රටවල් බිහිවීම. ( [illegible]
- සීතල යුද්ධය හෙවත් නිරවි යුද්ධය ක්‍රියාත්මක වීම.
- බල කඳවුරුවලට ගැති නොවූ රටවල් නොබැඳි ජාතීන් ලෙස සංවිධානය වීම.
- [illegible]
- [illegible]

( ලකුණු 3 +3 = 06 යි )

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

DUTCH GOVERNORS

| | |
|---|---|
| Willem J. Coster | 1640 |
| Jan Thyszoon (Payart) | 1640–46 |
| Jan Maatzuyker | 1646–50 |
| Jacob van Kittensteyn | 1650–53 |
| Adriaan van der Meijden (first term) | 1653–60 |
| Ryklof van Goens (first term) | 1660–61 |
| Adriaan van der Meijden (second term) | 1661–63 |
| Ryklof van Goens (second term) | 1663 |
| Jacob Hustaart | 1663–64 |
| Ryklof van Goens (third term) | 1664–75 |
| Ryklof van Goens Jr | 1675–80 |
| Laurens Pyl | 1680–92 |
| Thomas van Rhee | 1693–97 |
| Gerrit de Heere | 1697–1703 |
| Cornelis Jan Simons | 1703–07 |
| Hendrik Becker | 1707–16 |
| Isaac Augustin Rumpf | 1716–23 |
| Johannes Hertenberg | 1723–26 |
| Petrus Vuyst | 1726–29 |
| Stephanus Versluys | 1729–32 |
| Jacob Christiaan Pielat | 1732–34 |
| Diederik van Domburg | 1734–36 |
| Gustaaf Willem Baron van Imhoff | 1736–39 |
| Willem Maurits Bruyninek | 1739–42 |
| Daniel Overbeek | 1742–43 |
| Julius V.S. van Gollenesse | 1743–51 |
| Gerard Jan Vreelandt | 1751–52 |
| Johan Gideon Loten | 1752–57 |
| Jan Schreuder | 1757–62 |
| L.J. Baron van Eck | 1762–65 |
| Iman Willem Falck | 1765–85 |
| Willem J. van de Graaf | 1785–94 |
| J.G. van Angelbeek | 1794–96. |

WWW.OLEVELAPI.COM